[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| | | | |
|---|---|---|---|
| 07 ශ්‍රේණිය | විෂයය - ඉතිහාසය | පත්‍රය I/II | පැය - 02 යි. |

නම ..............................................................................................................................

### I කොටස

**ප්‍රශ්න අංක 1 - 20 තෙක් සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01) අතීත ජනතාවගේ විවිධ අවශ්‍යතා සඳහා කර්මාන්ත බිහිවිය. ඒ අනුව ලෝහ කර්මාන්තයට අයත් **නොවන්නේ** පහත සඳහන් කුමන කර්මාන්තයද ?
1. යකඩ  2. මැණික්  3. රන්  4. තඹ

02) පැරණි සමාජයේ මැටි කර්මාන්තයේ නියැලුණ ශිල්පීන් හඳුන්වන නාමය කුමක් ද?
1. කුම්බකාර  2. පෙහෙකාර  3. මණිකර  4. තොපෂ

03) අතීතයේ බිහි වූ වෙළඳ නගරයකි,
1. කැළණිය  2. කොළඹ  3. යාපනය  4. මාගම

04) බදුලු ටැම් ලිපිය පිහිටුවන ලද රජතුමා වන්නේ,
1. නිශ්ශංකමල්ල රජු  2. පස්වන මිහිඳු රජු
3. හතරවන උදය රජු  4. කාශ්‍යප රජු

05) අතීතයේ සූප ශාස්ත්‍රයෙහි දක්ෂ කාන්තාවන් හැඳින්වූයේ,
1. මධුපාචිකා  2. මධුභාෂිණි  3. නානාදේසි  4. ස්වර්ණකාර

06) පහත A හා B කොටස් නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| A | B |
|---|---|
| 1) වෙළඳ සංවිධාන | A රෙදිපිළි |
| 2) පේෂ කර්මාන්තය | B තවලම් |
| 3) වරායන් ආශ්‍රිතව කටයුතු කිරීම | C පූග |
| 4) ගවයන්ගේ පිටේ බඩු ගෙනයාම | D රේගු නිලධාරීන් |

1. ABCD  2. DEBA  3. BADC  4. CADB

07)

| A | B |
|---|---|
| 1) සාලි | A කුරක්කන් |
| 2) කටුසර බෝග | B කිරිගෙරි |
| 3) කිරි ලබාගැනීමට යොදාගත් දෙනුන් | C ගොඩගොවිතැන |
| 4) හේන් ගොවිතැන | D ඇල් වී |

1. DBAC  2. BACB  3. BCAD  4. DABC

08) **A** **B**

| A | B |
|---|---|
| 1) මානවම්ම කුමරුට හමුදාවක් ලබා දීම | A ශ්‍රීමාර ශ්‍රී වල්ලභ |
| 2) රෝමය සමඟ සබඳතා පැවැත්වීම | B වසභ රජු |
| 3) ලම්භකර්ණ පෙළපතට අයත් පාලකයෙකි | C පළමුවන නරසිංහ වර්මන් |
| 4) ලංකාව ආක්‍රමණය කළ පාණ්ඩ්‍ය රජෙකි | D භාතිකාභය රජු |

1. ADCB 2. CDBA 3. BCAD 4. CABD

09)

| A | B |
|---|---|
| 1) සෑම ගම් දහයකටම එක් වෛද්‍යවරයෙකු පත්කිරීම | A පළමුවන උපතිස්ස රජු |
| 2) අන්ධයන් හා රෝගීන්ට ආරෝග්‍යශාලා පිහිටුවීම | B පළමුවන උදය රජු |
| 3) පොළොන්නරුවේ ආරෝග්‍යශාලා පිහිටුවීම | C බුද්ධදාස රජු |
| 4) වසංගත රෝගීන්ට ආරෝග්‍යශාලා පිහිටුවීම | D පස්වන කස්සප රජු |

1. CABD 2. ABCD 3. BCDA 4. CDBA

10)

| A | B |
|---|---|
| 1) පල්ලව රාජ්‍යයේ අගනුවර ය | A මධුරාපුරය |
| 2) පාණ්ඩ්‍ය රාජ්‍යයේ අගනුවර ය | B කාංචිපුරය |
| 3) චෝල රාජ්‍යයේ අගනුවර ය | C රාෂ්ට්‍රකූට |
| 4) භාරතීය රාජ්‍යයකි | D තන්ජෝරය |

1. BADC 2. CDAB 3. DCAB 4. BDAC

11) අනුරාධපුර යුගයේ පැවති නීතිරීති ගැන මහජනතාවට දැනගැනීම සඳහා පිහිටවූ සෙල්ලිපියකි,
1. අඹගමුව ශිලා ලිපිය 2. තෝනිගල ශිලා ලිපිය
3. වේවැල්කැටිය ශිලා ලිපිය 4. මිහින්තලා පුවරු ලිපිය

12) චෝල පාලනයෙන් රජරට නිදහස් කරගෙන හෙළයේ අභිමානය නැවත ගොඩනැගූ රජතුමා වන්නේ,
1. පණ්ඩුකාභය රජු 2. විජය රජතුමා
3. නිශ්ශංකමල්ල රජු 4. පළමුවන විජයබාහු රජු

13) පරාක්‍රමබාහු කුමරා උපන් ස්ථානය ලෙස හඳුනාගෙන ඇත්තේ,
1. මාගම 2. පඬුවස් නුවර
3. දැදිගමකොට වෙහෙර 4. පනාකඩුව නම් ගමේ

14) පරාක්‍රම සමුද්‍රය ඉදිකිරීම සඳහා ඒකාබද්ධ කරන ලද වැව් දෙක වන්නේ,
1. අභය වැව හා බසක්කුලම වැවයි 2. තෝපා වැව හා දුඹුටුලු වැවයි
3. නාච්චදූව වැව හා නුවර වැවයි 4. හුරුළු වැව හා පදවිය වැවයි

15) පොළොන්නරුවේ ගල්පොත ශිලා ලිපිය පිහිටුවන ලද රජු ලෙස සඳහන් වන්නේ,
1. සුගලා බිසව 2. පරාක්‍රමබාහු රජතුමා
3. පළමුවන විජයබාහු රජතුමා 4. නිශ්ශංකමල්ල රජතුමා

16) ලෝක උරුමයක් වූ මොහෙන්ජොදාරෝ නගරය පිහිටි රට වන්නේ,
1. ඉන්දියාවයි 2. බංගලාදේශයයි 3. පකිස්ථානයයි 4. තායිලන්තයයි.

17) කුඩාවට ගොඩනඟා තිබූ ගාලු කොටුව ආරක්ෂක බලකොටුවක් ලෙස ශක්තිමත්ව ගොඩනඟන ලද්දේ,

1. පෘතුගීසි ජාතිකයන් ය
2. ලන්දේසි ජාතිකයන් ය
3. ප්‍රංශ ජාතිකයන් ය
4. ඉංග්‍රීසි ජාතිකයන් ය

18) පැරණි සිරිත් විරිත් පිළිබඳ හින්දු පොත්පත් වල සඳහන් අන්දමට උපතේ දී සිදු කළ යුතු සිරිත් විරිත් හඳුවන්නේ,

1. ජාත කර්ම නමිනි
2. කර්ණවේදන නමිනි
3. විද්‍යාරම්භ නමිනි
4. නාමකරණ නමිනි

19) ලංකාවේ වෙස්මුහුණු නිර්මාණ කලාවට ප්‍රසිද්ධ ප්‍රදේශය වන්නේ,

1. කඩුගන්නාව හා පිළිමතලාව
2. මාතලේ හා දිගන
3. දුම්බර හා හේවාහැට
4. අම්බලන්ගොඩ හා උඩුපිල

20) නිශ්ශංකමල්ල රජතුමා විසින් දළදා වහන්සේ තැන්පත් කිරීම සඳහා ඉදිකරන ලද නිර්මාණය හඳුන්වන්නේ,

1. හැටදාගෙය නමිනි
2. වටදාගෙය නමිනි
3. නිශ්ශංකලතා මණ්ඩපය නමිනි
4. අටදාගෙය නමිනි

**(ලකුණු 2×20=40)**

**II කොටස**

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **අනෙකුත් ප්‍රශ්න අතරින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව ප්‍රශ්න 5කි.**

01) මෙහි **A** හා **B** රූප දෙක ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



**A**

I.මෙම රූපය හඳුනාගෙන නම් කරන්න.
II. මෙය කරවූ රජතුමා කවුරුන් ද?
III. මෙය පිහිටි පැරණි නගරය කුමක්ද?
IV. ස්පෘශ්‍ය හා අස්පෘශ්‍ය උරුම අතරින් මෙය අයත් වන්නේ කුමකටද?

**(ලකුණු 2 X 4 = 8)**



**B**

I. මෙම රූපය හඳුනාගෙන නම් කරන්න.
II. මෙය දක්නට ලැබෙන ස්ථානය සඳහන් කරන්න.
III. කුමන යුගයකට මෙම නිර්මාණය අයත් වේද?
IV.මෙම ස්ථානය කරවූ රජතුමා කවුරුන්ද?

**(ලකුණු 2 X 4 = 8)**

02)
1). ඔබ දන්නා අප සතු අස්පෘශ්‍ය උරුම 3 ක් නම් කරන්න. (ලකුණු 03)
2). ශ්‍රී ලංකාවේ පිහිටි ස්පෘශ්‍ය උරුම දෙකක් උදාහරණ සහිතව ලියා දක්වන්න. (ලකුණු 04)
3). අපගේ අනන්‍යතාව පෙන්වන සාධක ලෙස ස්පෘශ්‍ය උරුම වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

03) පහත ප්‍රශ්න සඳහා පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

1). A - ලංකාවේ භාවිතා වූ මුල්ම කාසිය

B - අතීතයේ පැවති වෙළෙඳ ගම්

C - හෝපිටිගම වෙළෙඳපොළේ සිදු වූ අකටයුතුකම් නතර කිරීම

(බදුලු ටැම්ලිපිය , කහපණ , VOC කාසි , පටුන්ගම් , වේවැල් කැටිය ශිලා ලිපිය) (ලකුණු 03)

2). A - අතීතයේ වරායන් ආශ්‍රිතව කටයුතු කළ නිලධාරීන් හැඳින්වූ නම කුමක්ද?

B - මෙම නිලධාරීන්ට අයත් කාර්ය වූයේ කුමක්ද? (ලකුණු 04)

3). පැරණි ලංකාවේ අභ්‍යන්තර වෙළෙඳාම පිළිබඳ වාක්‍ය 5 ක් ලියන්න. (ලකුණු 05)

04)

1). අතීතයේ ශ්‍රී ලංකාව විදේශ වෙළෙඳ සබඳතා පැවැත් වූ රටවල් 3ක් නම් කරන්න. (ලකුණු 03)

2). විදේශ වෙළෙඳාමේ දී වැදගත් වූ පැරණි වෙළෙඳ වරායන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

3). විදේශ වෙළෙඳාම යටතේ ලංකාවෙන් ආනයනය කළ භාණ්ඩ දෙකක් හා අපනයනය කළ වෙළෙඳ භාණ්ඩ තුනක් නම් කරන්න. (ලකුණු 05)

05)

1). පැරන්නන් "අත්තම් ක්‍රමය" යනුවෙන් හැඳින්වූයේ කුමක්ද? (ලකුණු 03)

2). A - දියණිවරුන් සූපශාස්ත්‍රයෙහි දක්ෂයින් කිරීම දෙමාපිය වගකීම බව සඳහන් වන සාහිත්‍ය ග්‍රන්ථය කුමක්ද?

B - අශෝකමාලා කුමරිය රසවත්ව ආහාර පිළියෙල කළ බව සඳහන් සාහිත්‍ය ග්‍රන්ථය කුමක්ද? (ලකුණු 04)

3). අත්තම් ක්‍රමයට වැඩ කිරීමේ ඇති වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

06)

1). පහත සඳහන් ආගම් හා බැඳී පවතින සංස්කෘතික උත්සව එක බැගින් ලියන්න.

A - හින්දු B - ඉස්ලාම් C - ක්‍රිස්තියානි (ලකුණු 03)

2). පැරණි ලාංකික සමාජය තුළ පැවති පරපුරෙන් පරපුරට උරුම වූ යහපත් පුරුදු හතරක් ක් ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

3). අතීතයේ සිට පැවත එන ශ්‍රී ලාංකිකයන්ගේ සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳ වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 05)

07)

1). පොළොන්නරු යුගයේ රට පාලනය කළ රජවරු තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

2). පරාක්‍රම සමුද්‍රය කරවූ රජතුමා සඳහන්කර එතුමාගෙන් සිදු වූ ශාසනික සේවාවන් තුනක් ලියා දක්වන්න. (ලකුණු 04)

3). පහත සඳහන් ආගමික ගොඩනැගිලි අනුරාධපුර හා පොළොන්නරු යුගවලට අයත් ඒවාය. එම ස්ථාන යුග දෙකට වෙන්කර වගුවක් ඇසුරින් ඉදිරිපත් කරන්න.

(රුවන්වැලිසෑය, රන්කොත් වෙහෙර, හැටදාගෙය, සමාධි පිළිමය, කුට්ටම් පොකුණ, ගල්පොත ශිලා ලිපිය)

| අනුරාධපුර යුගය | පොළොන්නරු යුගය |
|---|---|
| | |
| | |
| | |

(ලකුණු 05)

## ඉතිහාසය 7 ශ්‍රේණිය පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 01) - II | 06) - IV | 11) - III | 16) - III |
| 02) - I | 07) - IV | 12) - IV | 17) - II |
| 03) - IV | 08) - II | 13) - III | 18) - I |
| 04) - IV | 09) - I | 14) - II | 19) - IV |
| 05) - I | 10) - I | 15) - IV | 20) - I |

### II කොටස

A රූපය

01)

1). නිශ්ශකලතා මණ්ඩපය

2). නිශ්ශංකමල්ල රජතුමා

3). පොළොන්නරුව

4). ස්පෘශ්‍යා උරුම

B රූපය

1). සීගිරි බිතු සිතුවම්

2). පළමුවන කාශ්‍යප රජු

3). අනුරාධපුර යුගය

4). සිගීරි බලකොටුවේ

02)

1). වෙසක් උත්සවය/ උපසම්පදා උත්සවය/ අළුත් අවුරුදු උත්සව/ ඇසල උත්සවය/ පෙරහැර

2). •පැරණි අනුරාධපුර නගරය උදා :- ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි සෑය, ලෝවාමහාපාය අභයගිරිය අනුරාධපුර නගරය තුල පිහිටි ස්ථාන

• පැරණි පොළොන්නරු නගරය :- වටදාගෙය, තිවංක පිළිමගෙය, රන්කොත් වෙහෙර

•සීගිරිය :- සිගිරි බලකොටුව, සිගිරි සිතුවම්, ජලමල් , පොකුණු, උද්‍යාන

3). •අපේ අතීත මුතුන් මිත්තන්ගේ නිර්මාණශිලී දැනුම හා ඔවුන්ගේ හැකියාවන් , අත්දැකීම් මෙම උරුමයන් හා බැඳි ඔවුන්ගේ හැකියාවන්, අත්දැකීම් මෙම උරුමයන් හා බැඳි පවතින බැවින් ඒවා අනාගත පරපුරට උරුම කරදීම වැදගත් බව

•ශ්‍රී ලාංකික සංස්කෘතිය ලොව හමුවේ දැක්වීමට හා අපේ අභිමානය පෙන්වීමට වැදගත්කම

•අපේ ජාතික උරුමයන් පිළිබඳ ලොව දැනුවත් වීමෙන් සංචාරක කර්මාන්තයේ දියුණුවට වැදගත් වන බව ඉහත කරුණු උදාහරණ සහිතව ඉදිරිපත් කර ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න.

03)

1). A - කහපණ B - පටුන්ගම් C - බඳුලු ටැම්ලිපිය

2). A - රේගු නිළධාරීන්
B - වරායවලට පැමිණෙන නැව් වලින් බදු එකතු කිරීම.

04)
1). ඉන්දියාව, චීනය, රෝමය, පර්සියාව, අරාබිය

2). මාතොට, ගෝකණ්ණ, ගොඩවැය

3).

| අපනයන | ආනයන |
|---|---|
| • ඇත්දත්<br>• මුතු මැණික්<br>• කුළුබඩු, ඖෂධ<br>• වටිනා දැව, ඇතුන් | පිඟන්, සේදරෙදි<br>සුවඳ විලවුන්, අශ්වයන් |

05)
1). ශ්‍රමයට ශ්‍රමය හුවමාරු කර ගැනීම

2). A - සහස්සවත්ථුපකරණය
B - සද්ධර්මාලංකාරය

3). එකිනෙකා අතර සුහදශීලී බව හා සහයෝගය
උපකාර කිරීම වැනි ගුණාංග වර්ධනය වීම
තමාම කළ උපකාරයට ප්‍රති උපකාර කිරීමට යොමුවීම
මෙම කරුණු විස්තර කර තිබීම අවශ්‍යය.

06)
1). A හින්දු - තෛපොංගල්
B ඉස්ලාම් - රාමසාන්
C ක්‍රිස්තියානි - නත්තල

2). වැඩිහිටියන්ට හා ගුරුවරුන්ට වැඳීම
අත්සෝදා ආහාර ගැනීම
නැති බැරි අයට උපකාර කිරීම
සතුන්ට කරුණාව දැක්වීම

3). පෙළපොත 43,44,45, පිටු වල සඳහන් කරුණු ඇසුරින් ළමයා අදහස් දක්වා ඇති ආකාරයඅනුව ලකුණු ප්‍රදානය කරන්න.

07).
1). මහා විජයබාහු, මහා පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල

2). මහා පරාක්‍රමබාහු රජතුමාගේ සේවාවන්

- ❖ තුන් නිකාය සමගි කර සංඝ ශාසනයේ සමගිය ඇති කිරීම
- ❖ පොළොන්නරු කතිකාවත පිහිටු වීමට පුරෝගාමී වීම
- ❖ පොළොන්නරු කතිකාවත ශිලා ලිපියක සටහන් කිරීම
- ❖ පොත්ගුල් විහාරය, කිරිවෙහෙර, පබළු වෙහෙර කරවීම
- ❖ අනුරාධපුර විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කරවීම

3). අනුරාධපුර යුගයට අයත් ස්ථාන,
රුවන්වැලිසෑය, සමාධි පිළිමය, කුට්ටම් පොකුණ

පොළොන්නරු යුගයට අයත් ස්ථාන,
රන්කොත් වෙහෙර, හැටදාගෙය, ගල්පොත ශිලා ලිපිය



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න